**"ශිල්ප අභිමානී" 2023**
**ජාතික හස්ත කර්මාන්ත තරගය සහ ජනාධිපති සම්මාන උළෙල**

**තරග කොන්දේසි**

01. ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි අදාළ පළාතේ දිස්ත්‍රික්කයක ස්ථිර පදිංචිකරුවෙක් විය යුතුය. ලියාපදිංචි නොවූ ශිල්පීන් නිර්මාණ ඉදිරිපත් කිරීමේ දී ලියාපදිංචි විය යුතුය.
02. තරගය සඳහා ඉදිරිපත් කරන නිර්මාණ අදාල ශිල්පියාගේ විය යුතු අතර, අර්ථවත් සංකල්පයක්, අලංකරණ හෝ උපයෝගීතාවයක්, කුසලතාවය හා නිපුණතාවය දැක්වෙන සමාජ ආර්ථික වටිනාකමක් සහිත නිර්මාණයක් විය යුතුය.
03. පාරම්පරිකව පැවත එන හෝ විධිමත් පුහුණුවකින් පසු පූර්ණකාලීනව හෝ අර්ධකාලීනව හස්ත කර්මාන්ත නිර්මාණය කරන ශිල්පියෙකු විය යුතු අතර වයස් සීමාවකින් තොරව මේ සඳහා ඉදිරිපත් විය හැකිය.
04. ජාතික ශිල්ප සභාව විසින් අනුමත කරන ලද ශිල්ප ක්ෂේත්‍රයන් යටතේ පමණක් නිර්මාණ ඉදිරිපත් කළ යුතුය.
05. තරගය සඳහා උපරිම නිර්මාණ 03 ක් ඉදිරිපත් කළ හැකිය.
06. අදාල දිනට නිසි ලෙස භාරදෙන නිර්මාණ පමණක් තරගය සඳහා වලංගු වේ.
07. තරගය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීමේ දී එක් නිර්මාණයකට අයිතිය ඇත්තේ එක් ශිල්පියෙකුට පමණි.
08. අඛණ්ඩව වසර 03ක් ස්වර්ණ සම්මාන හිමිකරගත් ශිල්පීන් හට වසර 02 ක කාලයකින් පසු නැවත තරගයට නිර්මාණ ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත.
09. ඇසුරුමක් යෙදිය යුතු නිර්මාණ වේ නම් ඒවා නිසි පරිදි සකසා තිබිය යුතු අතර සිහිවටන හා අනුරූ ශිල්ප ක්ෂේත්‍රය යටතේ ඉදිරිපත් කරන සියළු නිර්මාණ සඳහා ඇසුරුම්කරණය අනිවාර්ය වේ.
10. ජයග්‍රහණය කළ නිර්මාණ, අදාල ශිල්පියාගේ නොවන බව හෝ වෙනත් ප්‍රදර්ශන සඳහා හෝ ශිල්ප තරගවලදී මීට පෙර ඉදිරිපත් කරන ලද නිර්මාණයක් බව ඔප්පු වුවහොත් එම ශිල්පියාගේ නිර්මාණය සඳහා හිමි සම්මානය, ත්‍යාග මුදල් හා සහතිකපත්‍ර අවලංගු කිරීමේ සහ ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචිය වසර 05 කට අත්හිටුවීමේ බලය ජාතික ශිල්ප සභාව සතුය.
11. ශිල්පියෙකුට තම නිර්මාණ විකිණීමට අකමැති නම් ඒ පිළිබඳව අයදුම්පත්‍රයේ සඳහන් කළ යුතුය. නමුත් නිශ්චිත මිල/ වෙළෙඳපොල වටිනාකම සඳහන් කළ යුතුය.
12. මීට පෙර ජාතික ශිල්ප සභාවේ හෝ වෙනත් ආයතනයක ප්‍රදර්ශනයකට හෝ තරගයකට හෝ අලෙවියට ඉදිරිපත් නොකරන ලද නිර්මාණයක් විය යුතුය.
13. ජාතික ශිල්ප සභාවේ ලියාපදිංචි වී ඇති, ආයතනයේ ස්ථිර/ අනියම් සේවකයින්ට හෝ පවුලේ ඥාතීන්ට මෙම තරගය සඳහා ඉදිරිපත් විය හැකි අතර ස්ථිර/ අනියම් සේවකයින් මෙම තරගයට සහභාගී වීම සඳහා ජාතික ශිල්ප සභාවේ සභාපතිගේ හෝ අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතියක් ලිඛිතව ලබා ගත යුතුය. එමෙන්ම ප්‍රදර්ශන සංවිධාන කටයුතු වල යෙදෙන ජාතික ශිල්ප සභාවේ කාර්ය මණ්ඩලයට මේ සඳහා ඉදිරිපත් වීමේ හැකියාවක් නොමැත.

**තරග විනිශ්චය**

01. පළාත් තරඟ වල දී තරග අංශ සඳහා ප්‍රථම, දෙවන, තෙවන ස්ථානය පිරිනමනු ලැබේ. දුර්ලභ හා අභාවයට යමින් පවත්නා, පළාත් වලට විශේෂ වූ කලා ශිල්ප සඳහා මෙම තීරණය ලිහිල් කරනු ලැබේ. (දුම්බර රටා හණ, දුම්බර රටා කපු, ලෝහ භාවිත කලා ශිල්ප, වෙස් මුහුණු කලා ශිල්ප, රුකඩ කලා ශිල්ප, කැටයමු මුහුණු, ලාක්ෂා, සේසත්)
02. සාම්ප්‍රදායික මූර්ති අංශය සඳහා ඉදිරිපත් කරන නිර්මාණ පළාත් මට්ටමින් ජයග්‍රහණය කළ පසු ජාතික තරගය සඳහා නැවත සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති අතර අදාළ නිර්මාණයන්හි විනාඩි 02 කට නොවැඩි වීඩියෝ පටයක් සකස් කර ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. (උදා - බලි / ගොක් කොළ නිර්මාණ) එහෙත් අනෙකුත් නිර්මාණ නැවත ප්‍රති නිර්මාණය නොකල යුතුය.
03. පළාත් ප්‍රථම ස්ථාන අතරින් ජාතික ප්‍රථම ස්ථානයත්, ඉතිරි පළාත් ප්‍රථම හා දෙවන ස්ථාන වලින් ජාතික දෙවන ස්ථානයත්, ඉතිරි පළාත් ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන අතරින් ජාතික තෙවන ස්ථානයත් තෝරාගනු ලැබේ. ජාතික ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන සඳහා තෝරා ගැනීමෙන් පසු ඉතිරි වන නිර්මාණ අතරින් සෑම අංශයක් සඳහාම ජාතික කුසලතා 05 ක් බැගින් තෝරාගනු ලැබේ. ජාතික ප්‍රථම ස්ථාන අතරින් ප්‍රධාන ශිල්ප ක්ෂේත්‍ර 31 සඳහා රජත සම්මාන තෝරා ගනු ලබන අතර එම රජත සම්මාන අතරින් සාම්ප්‍රදායික කලා ශිල්ප හා නූතන කලා ශිල්ප යනුවෙන් ස්වර්ණ සම්මාන 02 ක් තෝරාගනු ලැබේ. රජත සම්මාන අතරින් ස්වර්ණ සම්මාන 02 ක් තෝරා ගැනීමෙන් පුරප්පාඩු වන රජත සම්මාන සඳහා අදාළ ක්ෂේත්‍රයෙන් සුදුසුකම් අනුව රජත සම්මාන 02 ක් ජාතික ප්‍රථම ස්ථාන වලින් තෝරා ගනු ලැබේ.
04. ජාතික ශිල්ප සභාව විසින් පත් කරනු ලබන විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය ලෙස පිළිගත යුතුය.